# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1981/28- 2016 අගෝස්තු මස 22 වැනි සඳුදා - 2016.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: WLP/ LAN/4/ACQ/04.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/12/2013/ED/512.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම / පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/ පරවශ්‍යතාවයේ විස්තරය*:-

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 375B සහබන්දු කොක්මාදුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කර ඇති මූලික පිඹුරු අංක 2656 හා 2016.07.14 දිනැති මූලික පිඹුරේ මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.8549 ක් වූ පහත සඳහන් පරිදි සවිස්තරව පෙන්නුම් කෙරෙන ඉඩම් කැබලි (07)

**1. කැබලි අංක 1**

ඉඩමේ නම: දෙල්ගහවෙල කුඹුර; විස්තරය: වගුරු බිම, කුඹුර; හිමිකම් කියන අය: නැසීගිය ජිනදාස කොඩිතුවක්කුගේ උරුමකරුවන්, සායක්කාර ජයවීර කංකානම්ගේ රිචඩ් සහ තවත් අය, කොක්මාදුව, වැලිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 2.3117.

**2. කැබලි අංක 2**

ඉඩමේ නම: දෙල්ගහවෙල කුඹුර සහ මොහොට්ටිවිල; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: කොඩිතුවක්කුගේ උදයසිරි, නැසීගිය ජිනදාස කොඩිතුවක්කුගේ උරුමකරුවන්, සායක්කාර ජයවීර කංකානම්ගේ රිචඩ් සහ තවත් අය, කොක්මාදුව, වැලිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2906.

**3. කැබලි අංක 3**

ඉඩමේ නම: දෙල්ගහවෙල කුඹුර සහ මොහොට්ටිවිල; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: නැසීගිය ජිනදාස කොඩිතුවක්කුගේ උරුමකරුවන්, සායක්කාර ජයවීර කංකානම්ගේ රිචඩ් සහ තවත් අය, කොක්මාදුව, වැලිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2305.

**4. කැබලි අංක 4**

ඉඩමේ නම: කැටපිටිය කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: සායක්කාර ජයවීර කංකානම්ගේ සීතාවති, කොක්මාදුව, වැලිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0085.

**5. කැබලි අංක 5**

ඉඩමේ නම: —; විස්තරය: ප්‍රාදේශීය සභා මාර්ගය; හිමිකම් කියන අය: සායක්කාර ජයවීර කංකානම්ගේ සීතාවති, කොක්මාදුව, වැලිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0012.

**6. කැබලි අංක 6**

ඉඩමේ නම: —; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0106.

**7. කැබලි අංක 7**

ඉඩමේ නම: —; විස්තරය: ප්‍රාදේශීය සභා මාර්ගය; හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0018.

ඉහත නම් සඳහන් ඉඩමට/ පරවශ්‍යතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ඔක්තෝබර් මස 07 වැනි දින පෙ. ව 10.00 වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2016 සැප්තැම්බර් මස 30 දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*



1A - G 24077- 32 - (2016/08))

පරවශ්‍යතාවට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2016 අගෝස්තු මස 18 වැනි දින,
වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09— 235

---

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන)පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: 8/3/5/3/4.
*අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/9/2013/WS474.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :-

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පහසියපත්තුව සුළු කොට්ඨාසයේ, රජ්ජම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද අංක 25 දරන අවසාන ගමේ පිඹුරේ කැබලි අංක 351 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.4274 ක් වූ ඉඩම් කොටස සඳහා මායිම්:

**කැබලි අංක 351**
**ඉඩමේ නම: රජ්ජම්මන වතුයාය; මුල් හිමිකම් කියන අය: හල්ගහවත්ත වලව්වේ ගුණපාල;**

මායිම්: *උතුරට*: කැබලි අංක 348; *නැගෙනහිරට*: කැබලි අංක 348 සහ 349; *දකුණට*: කැබලි 139 සහ 152; *බස්නාහිරට*: කැබලි අංක 132.

ඉහත සඳහන් ඉඩම සඳහා හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 සැප්තැම්බර් මස 26 වැනි දින ප. ව. 2.00ට මාතලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2016 සැප්තැම්බර් මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරික්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
*ප්‍රාදේශීය ලේකම්,*
*මාතලේ.*

2016 අගෝස්තු මස 15 වැනි දින,
මාතලේ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාලයේ දී ය.

09— 236

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.